(අටවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 1.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2020 ජනවාරි 03 වැනි සිකුරාදා පූ.භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

අතිගරු **ගෝඨාභය රාජපක්ෂ මහතා,** ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිතුමා

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ අමාත්‍යතුමා සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා සහ ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ සබඳතා අමාත්‍යතුමා සහ නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ අමාත්‍යතුමා සහ උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමා සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා,** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **ආරුමුගන් තොණ්ඩමන් මහතා,** ප්‍රජා සවිබලගැන්වීම් සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** අධිකරණ, මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්ද මහතා,** ධීවර හා ජලජ සම්පත් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මාර්ග සහ මහාමාර්ග අමාත්‍යතුමා සහ වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමා සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යතුමා සහ අභ්‍යන්තර වෙළෙඳ, ආහාර සුරක්ෂිතතාවය සහ පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමිය සහ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යතුමිය

ගරු **විමල් වීරවංශ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා සහ කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා,** බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා,** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දිළුම් අමුණුගම මහතා,** ප්‍රවාහන සේවා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** දේශීය වෛද්‍ය සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** මානව හිමිකම් හා නීති ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** ඉඩම් හා ඉඩම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී සම්පත් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත පෙරේරා මහතා,** ධීවර හා මිරිදිය මත්ස්‍ය කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** සංචාරක ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** ජාත්‍යන්තර සහයෝගීතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා,** අභ්‍යන්තර වෙළඳ සහ පාරිභෝගික සුභසාධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රොෂාන් රණසිංහ මහතා,** මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු සී. බී. රත්නායක මහතා,** දුම්රිය සේවා රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ලොහාන් රත්වත්තේ මහතා,** මහාමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතා,** ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු නිමල් ලාන්සා මහතා,** ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ගාමිණී ලොකුගේ මහතා,** නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජානක වක්කුඹුර මහතා,** අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු විදුර වික්‍රමනායක මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කංචන විජේසේකර මහතා,** තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ජයන්ත සමරවීර මහතා,** පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු මහින්ද සමරසිංහ මහතා,** රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා,** අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු තිලංග සුමතිපාල මහතා,** තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා,** ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ශෙහාන් සේමසිංහ මහතා,** සංවර්ධන බැංකු හා ණය යෝජනා රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

**ගරු කනක හේරත් මහතා,** වරාය සංවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

---

**ගරු තලතා අතුකෝරල මහත්මිය**

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**

**ගරු වජිර අබේවර්ධන මහතා**

**ගරු අශෝක් අබේසිංහ මහතා**

**ගරු සිසිර කුමාර අබේසේකර මහතා**

**ගරු ජෝන් අමරතුංග මහතා**

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

**ගරු (ආචාර්ය) සරත් අමුණුගම මහතා**

**ගරු ජේ. සී. අලවතුවල මහතා**

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**

**ගරු රංජිත් අලුවිහාරේ මහතා**

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**

**ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා**

**ගරු ටී. බී. ඒකනායක මහතා**

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**

ගරු රවී කරුණානායක මහතා
ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
ගරු ෆයිසාල් කාසිම් මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අ. අරවින්ද් කුමාර් මහතා
ගරු වේලු කුමාර් මහතා
ගරු නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා
ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු දුනේෂ් ගන්කන්ද මහතා
ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය
ගරු චන්දිම ගමගේ මහතා
ගරු දයා ගමගේ මහතා
ගරු පියසේන ගමගේ මහතා
ගරු සිරිපාල ගමලත් මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
ගරු ඩී. වී. චානක මහතා
ගරු සිසිර ජයකොඩි මහතා
ගරු මලිත් ජයතිලක මහතා
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
ගරු අනුරාධ ජයරත්න මහතා
ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
ගරු ලකී ජයවර්ධන මහතා
ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා
ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය
ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා
ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා
ගරු එම්. එස්. තෞෆික් මහතා
ගරු සිරිනාල් ද මෙල් මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
ගරු පලනි දිගම්බරම් මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු නවීන් දිසානායක මහතා
ගරු මයන්ත දිසානායක මහතා
ගරු වීරකුමාර දිසානායක මහතා
ගරු එච්. ආර්. සාරතී දුෂ්මන්ත මහතා
ගරු මුහම්මදු නසීර් මහතා
ගරු මනූෂ නානායක්කාර මහතා
ගරු එස්. බී. නාවින්න මහතා
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
ගරු බුද්ධික පතිරණ මහතා
ගරු කරුණාරත්න පරණවිතාන මහතා
ගරු කේ. කේ. පියදාස මහතා
ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
ගරු ඩිලාන් පෙරේරා මහතා
ගරු නිරෝෂන් පෙරේරා මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා
ගරු සුජිත් සංජය පෙරේරා මහතා
ගරු හරින් ප්‍රනාන්දු මහතා
ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
ගරු අශෝක ප්‍රියන්ත මහතා
ගරු ඒ. ඩී. ප්‍රේමදාස මහතා
ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා
ගරු එස්. ප්‍රේමරත්න මහතා
ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය
ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු පාලිත රන්ගේ බණ්ඩාර මහතා
ගරු ශාන්ත බණ්ඩාර මහතා
ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා
ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු තාරානාත් බස්නායක මහතා
ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා
ගරු එස්. එම්. මරික්කාර් මහතා
ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා
ගරු ඉම්රාන් මහරූෆ් මහතා
ගරු විජයකලා මහේස්වරන් මහත්මිය
ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
ගරු තිලක් මාරපන මහතා
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
ගරු නිශාන්ත මුතුහෙට්ටිගමගේ මහතා
ගරු ෆයිසර් මුස්තාපා මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු අර්ජුන රණතුංග මහතා
ගරු පාඨලී චම්පික රණවක මහතා
ගරු ප්‍රසන්න රණවීර මහතා
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
ගරු බිමල් රත්නායක මහතා
ගරු සාගල රත්නායක මහතා
ගරු ඉෂාක් රහුමාන් මහතා
ගරු මුජිබුර් රහුමාන් මහතා
ගරු හර්ෂණ රාජකරුණා මහතා
ගරු නාමල් රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා
ගරු අංගජන් රාමනාදන් මහතා
ගරු රන්ජන් රාමනායක මහතා
ගරු වරුණ ලියනගේ මහතා
ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
ගරු රනිල් වික්‍රමසිංහ මහතා
ගරු රුවන් විජයවර්ධන මහතා
ගරු ඒ. ඒ. විජේතුංග මහතා
ගරු ලක්ෂ්මන් ආනන්ද විජේමාන්න මහතා
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
ගරු චමින්ද විජේසිරි මහතා
ගරු ඩුලිප් විජේසේකර මහතා
ගරු හේෂා විතානගේ මහතා
ගරු තේනුක විදානගමගේ මහතා
ගරු එස්. වියාලේන්දිරන් මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු කුමාර වෙල්ගම මහතා
ගරු එස්. ශ්‍රීතරන් මහතා
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
ගරු මලික් සමරවික්‍රම මහතා
ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
ගරු සන්දිත් සමරසිංහ මහතා
ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා
ගරු මුත්තු සිවලිංගම් මහතා
ගරු අන්නාමලෙයි නඩේසු සිවශක්ති මහතා
ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා
ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා
ගරු වඩිවේල් සුරේෂ් මහතා
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
ගරු සුජීව සේනසිංහ මහතා
ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
ගරු වසන්ත සේනානායක මහතා
ගරු චතුර සංදීප සේනාරත්න මහතා
ගරු විජිත් විජයමුණි සොයිසා මහතා
ගරු ඩී. එම්. ස්වාමිනාදන් මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
ගරු එච්. එම්. එම්. හරීස් මහතා
ගරු අබ්දුල් හලීම් මහතා
ගරු කබීර් හෂීම් මහතා
ගරු පී. හැරිසන් මහතා
ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
ගරු ඩී. බී. හේරත් මහතා
ගරු විජිත හේරත් මහතා
ගරු මනෝජ් හේවාගම්පලගේ මහතා
ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා
ගරු ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**අතිගරු ජනාධිපතිවරයා විසින් 2019 දෙසැම්බර් 02 වැනි දින නිකුත් කරන ලද ප්‍රකාශනය අනුව පාර්ලිමේන්තුව රැස්විය. අතිගරු ජනාධිපතිවරයා පෙරහරින් සභා ගර්භයට සම්ප්‍රාප්ත වූයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(ආ) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිවරයා පූ. භා. 10.00ට මූලාසනාරූඪ විය.**

**1.** **පාර්ලිමේන්තුවේ වාරාවසාන කිරීමේ සහ රැස්වීම කැඳවීමේ අතිගරු ජනාධිපතිවරයාගේ මතු පළවන ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා විසින් කියවන ලදී:—**

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2152/7 - 2019 දෙසැම්බර් මස 02 වැනි සඳුදා - 2019.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

**ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය**

අතිගරු ජනාධිපතිතුමා විසින් කරනු ලබන ප්‍රකාශනයයි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, මෙම ප්‍රකාශනයෙන් වර්ෂ දෙදහස් දහනවයක් වූ දෙසැම්බර් මස දෙවන දින මධ්‍යම රාත්‍රියේ සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුවේ වාරාවසාන කරන බවත්, පාර්ලිමේන්තුවේ මීළඟ වාරය පටන් ගැනීම වර්ෂ දෙදහස් විස්සක් වූ ජනවාරි මස තුන්වන දින පෙ.ව. 10.00 ලෙස නියම කොට, ශ්‍රී ජයවර්ධනපුර පාර්ලිමේන්තු රැස්වීම් ශාලාවේදී රැස්වීම පිණිස පාර්ලිමේන්තුව කැඳවන බවත් මෙයින් දැනගත යුතුය.

වර්ෂ දෙදහස් දහනවයක් වූ දෙසැම්බර් මස දෙවන දින වූ මෙදින කොළඹ දී නිකුත් කරන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී.බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

1A - G 31475 — 382 (2019/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2. අතිගරු ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව ඇමතීම :** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(2)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව අමතන ලදී.

**රැස්වීම තාවකාලිකව අත්හිටවීම**

පූ.භා. 10.35

අ.භා. 1.00 වන තෙක් රැස්වීම තාවකාලිකව අත්හිටවන ලදී.

අ.භා. 1.00

රැස්වීම යළිත් එක්රැස්වූයෙන් කථානායකවරයා මූලාසනාරූඪ විය.

**3. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම :** රත්නපුර මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු උඩගම ලියනගේ වරුණ ප්‍රියන්ත ලියනගේ මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභාමේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේය.

**4. ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ :** ජනාධිපතිවරයාගෙන් ලැබුණු මතු පළවන සංදේශය කථානායකවරයා විසින් කියවන ලදී:—

ශ්‍රී ලංකා ජනාධිපති
இலங்கை சனாதிபதி
President of Sri Lanka

මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/1/12/7

2019 දෙසැම්බර් මස 19 වන දින

**ගරු කරු ජයසූරිය මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛණයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

**ගෝඨාභය රාජපක්ෂ**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு
Democratic Socialist Republic of Sri Lanka

**5. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන :** කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

**I**

"පාර්ලිමේන්තුවේ සභානායක ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ද ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ධුරය සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ද පත් කරනු ලැබ ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි."

**II**

පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකයා ලෙස ගරු සජිත් ප්‍රේමදාස මහතා මෙම ගරු සභාව විසින් පිළිගන්නා බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි."

**III**

"විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා ලෙස ගරු ගයන්ත කරුණාතිලක මහතා පත් කර ඇති බව මෙම සභාවට දැනුම් දීමට කැමැත්තෙමි."

**IV**

"රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ටී. රංජිත් ද සොයිසා මහතාගේ අභාවය මෙම පාර්ලිමේන්තුවට මා දන්වා සිටින්නේ බලවත් කනගාටුවෙනි. එතුමාගේ අභාවයෙන් අපට සිදුවී ඇති පාඩුව ගැන අප ඇඩිසේ දුක්වන අතර මෙම ගරු මන්ත්‍රීවරයාගේ පවුලේ අය වෙත අපගේ සාතිශය සංවේගය ප්‍රකාශ කරන බව මෙම පාර්ලිමේන්තුව වෙනුවෙන් මම දන්වනු කැමැත්තෙමි.

මේ පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාව මතු දිනයකදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ඇත."

**V**

"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2019 නොවැම්බර් 15 දින 'ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය' සහ 2019 නොවැම්බර් 18 දින 'ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ)' සහ 'ක්‍රීඩාවලට සම්බන්ධ වැරදි වැළැක්වීමේ' නමැති පනත් කෙටුම්පත්වල ම'විසින් සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි."

**6. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** කථානායකවරයා විසින්—

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව සහ 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 30 වගන්තිය ප්‍රකාරව, 2017 වර්ෂයේ සිව්වැනි කාර්තුව සහ 2018 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිව්වැනි කාර්තු සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තා;

(ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2017 වර්ෂයේ තෙවැනි සහ සිව්වැනි කාර්තු සහ 2018 වර්ෂයේ පළමුවැනි, දෙවැනි, තෙවැනි සහ සිව්වැනි කාර්තු සඳහා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ වාර්තා;

(iii) 2019 වර්ෂයේ දෙවැනි කාර්තුව සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 වර්ෂයේ තෙවැනි කාර්තුව සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තා **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**7. කාරක සභා වාර්තා පිළිගැන්වීම :** අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා විසින්, එකී කාරක සභාව විසින් සකස් කරන ලද "STEM අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ උපායමාර්ගික සැලැස්ම 2020 – 2030" සම්බන්ධයෙන් වූ වාර්තාව පිළිගන්වන ලදී.

එකියන ලද වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**8. ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2018 සැප්තැම්බර් 07 දින කථානායකවරයා විසින් පත්කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සහජීවනය සහතික කිරීම පිණිස ඒ පිළිබඳව අධ්‍යයනය කර සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, තමන් විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2018 සැප්තැම්බර් 04 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති කාලසීමාව ඇතුළත පාර්ලිමේන්තුවට අතුරු වාර්තාවක් මඟින් ඉදිරිපත් කර ඇති අතර අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමට එම කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව, 2020 ජුලි 12 දින දක්වා දීර්ඝ කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. කල් තැබීම :** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා.1.30ට 2020 ජනවාරි 07 වැනි අඟහරුවාදා අ.භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.